රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/98

මගේ අංකය : II/719/ඊ/201/42
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998 මාර්තු මස 11 වැනි දින.

සියළුම ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>හදිසි මරණ පරීක්ෂකවරුන්ට කරනු ලබන ගෙවීම්.</u>**

ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ **3** වන වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එහි 3:4 හා 3:5 වගන්තිවල සඳහන් සැතපුම් කුලිය සහ යැපීම් දීමනා පහත දක්වා ඇති අයුරින් සංශෝධනය කරමි.

**<u>3 : 4 වගන්තිය :-</u>**

පොදු වාහන සේවාවක් නොමැති මාර්ගයක යන ගමනක් හෝ ගමනක කොටසක් සඳහා සැතපුමකට රු. 10/- බැගින් සැතපුම් කුලිය ගෙවනු ලැබේ.

**<u>3 : 5 වගන්තිය :-</u>**

ආණ්ඩුවේ වේතනික නිලධාරීන් නොවන හදිසි මරණ පරීක්ෂකයන්ට ඉන්ක්වැස්ට් විභාගයක් සඳහා ගෙදරින් පිටවී සිටීම අවශ්‍ය වන කාල පරිච්ඡේදය වෙනුවෙන් පහත සඳහන් ගාස්තු අනුව යැපීම් දීමනාව ගෙවනු ලැබේ.

| | |
|---|---|
| එක් එක් සම්පූර්ණ පැය 24 ක කාලයකට | රු. 280.00 යි. |
| පැය 12 කට නොඅඩු කාලයක් සඳහා | රු. 280.00 යි. |
| පැය 06 කට නොඅඩු කාලයක් සඳහා | රු. 140.00 යි. |

මෙම සංශෝධන ගාස්තු 1998 ජනවාරි මස 01 වන දින සිට බල පැවැත්වේ. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත නිකුත් කරනු ලැබේ.

අ.කලේ (ඩික්සන් නිලවීර)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය